# 10
# පීඩා තුළ මෙහෙවර



දමස්කයේ දී පාවුල්තුමා දුටු දර්ශනයෙන් පසු එතුමා ගැන අනනියස්ට ස්වාමින් වහන්සේ පැවසුවේ " ඔහු මාගේ නාමය නිසා කොපමණ දුක් විඳින්න ඕනෑ දැයි කියා ඔහුට දන්වන බව යි. මේ අනුව පාවුල් ඒ අත්දැකීම ලැබූ ආකාරය මේ පාඩම තුළින් පෙන්වා දෙයි.

අගබස් : දිවැස්වැකි මඟින් සිදු වන දේ ?

පාවුල්ගේ ඉඟපටිය රැගෙන එයින් තමාගේ අත බැඳගෙන " ජුදෙව්වරු මේ ඉඟපටිය අයිති මිනිසා ජෙරුසලමේ මේ ආකාරයෙන් බැඳ විජාතීන්ගේ අත්වලට පාවා දෙති. " අගබස් දිවැසිවරයා පැවසීම.

සෙනඟ ජෙරුසලමට නොයන ලෙස පාවුල්ගෙන් උදක් ම ඉල්ලීම.

පිළිතුර
" හැඬීමෙන් මා අධිෂ්ඨානය දුර්වල කරන්නෙහි ද? ජේසුස් වහන්සේගේ නාමය නිසා හිරගෙදර පමණක් නොව මැරෙන්නට වුව ද සූදානම් ය" යනුවෙන් පාවුල් පැවසී ය.

ජේසුස් වහන්සේ වෙනුවෙන් පාවුල් මෙහෙවරෙහි යෙදුන අතර උන්වහන්සේ වෙනුවෙන් ඕනෑම දෙයක් අත්හැරීමට වුවත් ඔහු සූදානම් විය.

## ජේසුස් වහන්සේ උදෙසා සිරගතවීම (ක්‍රියා 21 : 27 - 27 පරිච්ඡේදය)

ජේසුස් වහන්සේ උදෙසා පීඩා විඳීම සම්බන්ධයෙන් බයිබල් කොටස් කියවා සාරාංශ කරමින් පහත වගුව පුරවන්න.
(ඉගැන්වීම් අතර තුර ඇගයීමක් ලෙස මෙය භාවිත කළ හැකි ය.)

| අවස්ථා | පීඩාව හා මුහුණ දුන් දුක් පීඩා | ජයග්‍රහණය කිරීම තුළ සාක්ෂ්‍යය දැරූ අන්දම |
|---|---|---|
| (1) දේව මාලිගාවේ දී අත් අඩංගුවට පත් වීම (ක්‍රියා 21:27 22:29) | | |
| (2) ජුදෙව් මන්ත්‍රණ සභාව ඉදිරිපිට (ක්‍රියා 22:30 23:22) | | |
| (3) පාවුල් ෆීලික්ස් ආණ්ඩුකාරයා වෙත යැවීම (ක්‍රියා 23:23 25 පරිච්ඡේදය) | | |
| (4) පොර්කියුස් ෆෙස්තස් (ක්‍රියා 25:01 13 ) | | |
| (5) අග්‍රිපා රජු (ක්‍රියා 25:13 32 ) | | |

## දේව මාලිගාවේ දී අත් අඩංගුවට පත් වීම

(10 පෙළ පොත 4 පිටුවේ ඇති දේව මාලිගාවේ ආකෘතිය බලන්න. අන්‍ය ජාතීන්ට සිටිය හැක්කේ දේව මාලිගාවේ බාහිර මළුවෙහි පමණි.)

එපීස වැසියකු වූ ත්‍රොපිමස් ඔහු සමඟ නුවර සිටි නිසා ඔහු දේව මාලිගාවට ගෙන ආ බව සිතීම පාවුල් සිරබාරයට පත් වීමට හේතුවයි.

මේ පලස්තීන ප්‍රදේශය රෝමයට යටත් විජිතයක් ව පැවතිණි. බදු ගෙවන රටක් ලෙස පැවති මෙයට තම අභ්‍යන්තර පරිපාලනය එසේ ම පවත්වා ගෙන යාමට ඉඩ සලසා ඇත. එම නිසා මෙහි පරිපාලන නීතී වර්ග දෙකකි.

1. ජුදෙව් ව්‍යවස්ථාව අනුව අධිකරණය
2. රෝම ව්‍යවස්ථාව අනුව අධිකරණය

ජුදෙව් ව්‍යවස්ථාව අනුව වූ අධිකරණයෙහි සිවිල් ප්‍රශ්න විසඳන ලදී. අපරාධ නඩු හා අධිරාජ්‍යයාට සම්බන්ධ නඩු රෝම ව්‍යවස්ථාව අනුව විසඳන ලදී. පාවුල් ව මුලින් ම ගෙන යනු ලැබුවේ ජුදෙව් ව්‍යවස්ථාව අනුව විනිශ්චය සඳහා ය. ජේසුස් වහන්සේ මෙන් ම එහිදී එතුමාට ඉදිරිපත් වුයේ ව්‍යවස්ථාව සම්බන්ධ වැරදි ය. නමුත් රෝම ව්‍යවස්ථාව අනුව විනිශ්චයේ දී ජේසුස් වහන්සේ මෙන් ම දේශපාලනමය වැරදි ස්වභාවයක් ඔහුට ද ඇති විය.

1. ජුදෙව්වන් අතර කැරළි උපදවන්නෙක්
2. නාසරිය නිකායේ කැරළි කරුවෙක්
3. දේව මාලිගාව කෙලසන්නෙක්

යන චෝදනාවලට මුහුණ දීමට පාවුල්ට සිදු විය. ඒ සඳහා පාවුල් රෝමයට ගෙන යන ලදී.

එසේ ම මෙසේ දුක් විඳීමට මුහුණ දුන්නේ පාවුල්තුමා පමණක් නොවේ. ක්‍රියා 8 : 1 සඳහන් ආකාරයට මුල් සභාව ද විවිධ පීඩා තුළ මෙහෙවර ඉදිරියට ගෙන ගිය බව සඳහන් වේ. මේ අනුව විවිධ පීඩා තුළින් ධර්ම ප්‍රචාරය වැළකිය නොහැකි වූ අතර සිදු වුයේ වඩ වඩා ධර්මය ප්‍රචාරය වීම ය. නමුත් සාක්ෂි දැරීම කියා පීඩා විඳීමට පත්වීම අවශ්‍ය නැත. නමුත් පීඩා විඳීමට සිදුවුවහොත් අප්‍රතිහත ධෛර්යයෙන් ධර්ම ප්‍රචාරණ කටයුතු කිරීමේ වගකීමට අපි ද යොමු වෙමු.

"ඔබ පමණක් නොව අද මාගේ වචන අසන සියල්ලන් ද පහසුවෙන් හෝ අපහසුවෙන් හෝ මාගේ මේ යදම් නොමැති ව මාගේ ම වන ලෙස දෙවියන් වහන්සේට යාඥා කරමි" පාවුල් පැවසීය. (ක්‍රියා 26:29)

සීසර්ගේ විනිශ්චය නොඉල්ලුවේ නම් නිදහස් කරන්නට තිබුණේ යැ යි අග්‍රිපා රජ පැවසුවේ ය. නමුත් නිදහස් වීමට වඩා රෝමයේ සාක්ෂිය දැරීම වැදගත් යැ යි පාවුල් සිතුවා විය හැකි ය.

❖ **ඇගැයීම** :-

01. " ඔබ පමණක් නොව අද මාගේ වචන අසන සියල්ලන් ද පහසුවෙන් හෝ අපහසුවෙන් හෝ මාගේ මේ යදම් නොමැති ව මා වගේ වන ලෙස දෙවියන් වහන්සේට යාඥා කරමි." මෙහි අර්ථය පහදා ඔබ එය අද දින ඉටු කරන්නේ දැයි සාක්ෂි සහිත ව දක්වන්න.

02. පහත ගීය ගායනා කරන අතර එහි අරුත්වල ඇති වෙනස් කම් සසඳන්න. එය වගුගත කරන්න.

කුරුස සේනාවෙනි
පිබිදෙන්න සැණෙන්
අසහනෙන් අධර්මෙන්
අයුක්තෙන් බේදයෙන්
යාපත පිරිහෙමින්
ලෝ පිරෙයි දසතින්
මොහොතක් පමා නොවන්
අරඹන්න සටන්

කුරුස සේනාවෙනි
කිකරු ව එන්න
අණට කන් දෙමින්
සටන් පෙරමුණ
ජේසුස් වෙයි ඉදිරියෙන්
විමුක්තිය නායක
ජය අත් වෙයි නියතින්
එය වේ නිසක

ක්‍රිස්තියානි ගීතිකා : ( ශ්‍රී ලංකා ක්‍රිස්තායානි පොත් ප්‍රකාශන මණ්ඩලය 1986 ) 336 වන ගීතිකාව. ගීතිකා තාල පොත තාලයට ගීතය ගායනා කරන්න.

ලෝක ධර්මය නම් නොවෙයි මෙය
සාමයේ පුවත් තමයි
පැවසුවේ මේ දේ අප හට
අපගේ සමිඳුන් ම ය

සිතින් දිලින්දෝ වෙයි වාසනා
සඟ ලොව රජ පුරයේ
සෝක වන්නෝ වෙයි සැමදා
සන සනු ලැබුයේ
සියුම් සිතැත්තෝ ලබයි පොළොව ද
ආසිරි ඔවුනට වේ
දම්ටුවන් හට වෙයි සැම සිරි
සාමය සතුට ගෙනෙයි

ලෝක ධර්මය........

දයාව ගෙන එන්නෝ මිහිපිට
එයම නැවත ලබයි
සිතින් පිවිතුරන් අප සැම අතරින්
දෙවිඳු දකින්නෝ මැයි
දෙවි පුත් බව ලැබුයේ අද ඔබ
සාමයේ පැතුම් නිසායි
පීඩා විඳි ඔබ දම්ටු කම් හට
සඟ ලොව උරුම කරයි

ලෝක ධර්මය........

කිතුනු ගීත පොත පිටුව 16 ගීතය 37
තාලයට ගීතය ගායනා කරන්න